# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 78 — 1973 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා — 1973.09.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... ... ... | 1243 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1258 |



සැළකිය යුතුයි.—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 36 දරන මෝටර් ගමනාගමන (සංශෝධන) පනත 1973 සැප්තැම්බර් 21 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ දෙවන කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ. (ii) ජාතික ලේඛනාරක්ෂක පනත් කෙටුම් පත, මුදල් පනත් කෙටුම්පත, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත් කෙටුම් පත සහ ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත් කෙටුම් පත 1973 සැප්තැම්බර් 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

## තනතුරු — ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන්ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

1243— බී 71019—15,065 (73/09)

B 1අ

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප් වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නියෝග කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසි වලට අතිරේක වශයෙන් පහත දැක්වන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාල වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් ( අවශ්‍ය නම් ), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයෙහි අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්ම නව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත්, එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 : වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත් වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේ දී සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡෙදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4 සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූ ද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන් ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටු දායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමනුමින් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තා වූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් ඇවිමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් වකර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එකිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරාගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ග්‍රාමීය ක්‍රම සම්පාදන නිර්මාණ ශිල්පී තනතුර**

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ග්‍රාමීය ක්‍රම සම්පාදන නිර්මාණ ශිල්පී තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම දැන්වීමට යා කර තිබෙන ආකෘති පත්‍රයේ පිළියෙළ කරන ලද ඉල්ලුම්පත් පහත සඳහන් දිනවල හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 512, වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ 'ග්‍රාමීය ක්‍රමසම්පාදන නිර්මාණ ශිල්පී තනතුර' යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

(අ) මෙරට ඉල්ලුම් පත් : 1973 නොවැම්බර් මස 5 වැනි දින.

(ආ) විදේශීය ඉල්ලුම් පත් : 1973 නොවැම්බර් මස 5 වැනි දින.

**සටහන්.**—(i) පිටරට අයදුම්කරුවන්ට තම ඉල්ලුම්පත් වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(ii) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත කරනු පිණිස විදෙශයෙන තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තු වත් ලංකාවට පැමිණීම සඳහා වන ගමන් ගාස්තුවත් තමන් විසින් දරා ගත යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. දැනට මත් රජයේ සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු තෝරාගනු ලැබුවහොත් එම තනතුර ඉදිරියටත් බලපවත්වනු ඇත.

**3. වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේය : වියකට රු. 17,040—3×600—රු. 18,840 (1969. 10. 01 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය නම් වසකට රු. 13.800—3×600—රු. 15,600).

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුතු බව.

(ආ) 1973 නොවැම්බර් 5 වැනි දිනට වයස අවුරුදු 35 ට නොඅඩු බව. එමෙන්ම අවුරුදු 45 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ හෝ සංස්ථාවන්හි ස්ථිර සේවයේ නියුතු වූවනහට මෙම වයස් සීමාව බල නොපානු ඇත.)

(ඇ) (i) නිර්මාණ ශිල්පය [illegible] පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්
සහ
(ii) බ්‍රිතාන්‍ය නිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ/ රාජකීය ඕස්ට්‍රේලියානු නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.
සහ
(iii) අවුරුදු 10 ක පළපුරුද්දක්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

අ) උප්පැන්න සහතිකය. (සැලකිය යුතුයි.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාර ගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.)

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.— (i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය / සංස්ථා සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත් බාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ට දැනගැනීමට හැකි වන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

පී. සිවශුණම්,
අති/ලේ. (පාලන),
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

1973 සැප්තැම්බර් 7 වැනි දින,
තැ. පෙ. 512,
කොළඹ 1,
ගාලුමෝදර මහාලේකම් ගොඩනැගිල්ලේ,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේදී ය.

**ග්‍රාමීය ක්‍රමසම්පාදන නිර්මාණ ශිල්පී තනතුර සඳහා වූ ආදර්ශ ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :———.

2. ස්ථිර ලිපිනය :———.

3. (අ) උපන් දිනය :———.
   (ආ) 1973 නොවැම්බර් 5 දිනට වයස :—
   අවු :——, මාස :——, දින :——.

4. ජාතිය :———.
(අ) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද, යන වග :———.
(ආ) ලාංකිකත්වය පරම්පරාවෙන් නම්, පහත දැක්වෙන අය උපන් ස්ථානය සඳහන් කරන්න :—
   (i) අයදුම්කරු :———.
   (ii) අයදුම්කරුගේ පියා :———.
   (iii) අයදුම්කරුගේ පියාගේ පියා :———.
   (iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :———.

5. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :———.
   (ආ) විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවකද යන වග :———.

6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :———.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
   (i) සිංහල :———.
   (ii) දෙමළ :———.
   (iii) ඉංග්‍රීසි :———.

8. ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණද? :———.

9. ඔබ සාපරාධී වරදකට උසාවියේදී චෝදනා ලැබුවෙක් ද, එසේ නම්, දිනයත් හා නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සපයන්න :———.

10. දැනට කරන රැකියාව හා ඊට ප්‍රථම කරන ලද රැකියාවන් (විස්තර සඳහන් කරන්න) :———.

11. වෙනත් තොරතුරු කිසිවක් වෙත් නම් :———.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

9-530 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1973 ඔක්තෝබර් මස 5 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් අයදුම්පත් භාර ගැනීම අවසන් කෙරේ.

වැඩිදුර විස්තර අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ලියා විමසන්න. කිසිම ලියවිල්ලක් පහත අත්සන් කරන අයගේ පුද්ගලික නමට එවිය යුතු නොවේ.

ජී. අමරසේන,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

සෞඛ්‍ය අමාත්‍යාංශය,
තැ. පෙ. 500, ගාලු මුවදොර,
කොළඹ, 1973 සැප්තැම්බර් 03 වන දින.

9-535—73.09.21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුර**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973. 10. 12 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත එවිය යුතුයි.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 6,720—12×360—රු. 11,040 වැටුප් ක්‍රමයක් මේ තනතුරට හිමිවේ.

3. **පත්වීම් කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් උසුලන නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් අංක 42 හා 71. 12. 24 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට යටත් වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු අනුව කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—
   (අ) 1973.10.12 වැනි දිනට වයස අවුරුදු 20 ට නො අඩු සහ අවුරුදු 40 ට නොවැඩි බව, දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපවත්වන්නේ නැත.
   (ආ) විශිෂ්ඨ චරිතයකින් සුහ හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.
   (ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය දරන්නකු බව.

සටහන.—පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිලි දක්වනු ලැබේ :—
   (i) සිංහල භාෂාවෙහි සහ දෙමළ භාෂාවෙහි මනා දැනුමක් ඇති.
   (ii) සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, මානව විද්‍යාව, අධ්‍යාපනය යන සමාජ විද්‍යාවන්හි හෝ ස්වාභාවික විද්‍යාවෙහි සමාර්ථයක් ලබා ඇති.
   (iii) රජය මඟින් හෝ පිළිගත් ස්වේච්ඡා සංවිධානයක් මඟින් හෝ වැටුප් ලබන, අධ්‍යාපනය, සමාජ සේවය හෝ සෞඛ්‍ය කාර්යයෙහි පළපුරුද්දක් ලබා ඇති.

5. **සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අයදුම්කරුවා රජයේ සේවයට නව ප්‍රවේශකයකු නම් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා—
   (අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් වේ. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙකු තෝරාගනු ලැබුව හොත්, පත්වීම අවුරුද්දක කාලයක් වැඩ බැලීමේ පදනම මත වේ. වැඩබලන කාලයේදී සේවය අසතුටුදායක නම් කලින් ඉසුලූ තනතුරට ආපසු යවනු ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත වූවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එවැනි ඉල්ලුම්පත්‍ර නියම කරන ලද දිනට පෙර මෙම කාර්යාලය වෙත නොලැබුනහොත්, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අයදුම්කරුවන් තම අයදුම්පත්වලට පහත සඳහන් ලියකියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුනා එවිය යුතුය :—
   (අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික සහ වෘත්තීය සහතික.
   (ආ) අයදුම්කරුවන්ගේ චරිතය හා මෙම තනතුරට පත් කිරීම උදෙසා ඇති යෝග්‍යතාවය දැක්වෙන මෑතකදී ලබාගත් සහතික තුනක්. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් මෙම සහතික ඉදිරිපත් කළ යුතු නොවේ.)

8. අයදුම්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට හැර, මා වෙත පෞද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි ද අවධානය යොමු කරවනු ලැබේ.

ජී. අමරසේන,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

1973 සැප්තැම්බර් මස 7 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

**අයදුම් පත**

සෞඛ්‍ය අමාත්‍යාංශය

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුර**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)
(අ) පෙළපත් නාමය :————.
(ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
(ආ) 1973.10.12 වැනි දිනට වයස :—අවුරුදු :—මාස :—දින :—
4. ජාතිය :————.
5. උපන් ස්ථානය :————.
6. අයදුම්කරු විවාහක, අවිවාහක හෝ වැන්දඹු බව :————.
7. ඔබගේ, (අ) පොදු අධ්‍යාපනය :————.
(ආ) වෘත්තීය අධ්‍යාපනය :————.
යන සම්බන්ධයෙන් ඉගෙනීම ලැබූ පාසැල් සහ විද්‍යාලවල නම්. (පාසැල්වලට සහ විද්‍යාලවලට ඇතුලු වූ හා අස්වූ දින සහිතව දක්වන්න).
8. අධ්‍යාපන සුදුසුකම් (සමත් වී ඇති උසස්ම විභාගයේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.) :————.
9. වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලබා තිබේද? එසේ නම්, ඒවා ලබාගත් දිනයන් :————.
10. විද්‍යාලයෙන් අස්වූවාට පසු රැකියාවක යෙදුණේ නම්, ඒ පිළිබඳ විස්තර :————.
11. විශේෂ ශිම්කම්, සුදුසුකම්, පුහුණුව හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.
12. සිංහල භාෂාවේ ප්‍රවීණතාවය :————.
13. තොරතුරු දැනගත හැකි තිදෙනකුගේ නම්, ඔවුන්ගේ ලිපිනය සහ පදවි නාමය දක්වන්න :—
(1) ————.
(2) ————.
(3) ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-512—73.09.21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

සහකාර සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහකාර සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1973.10.12 වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය—වර්ෂයකට රුපියල් 6,600—240 × 5—360 × 4—රුපියල් 9,240 දක්වා වේ. රුපියල් 8,220 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් අයකරනු ලැබේ. විශ්‍රාම වැටුප් සහිත ආණ්ඩුවේ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් 71.12.24 දින සහ අංක 42 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අදාලවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කළ යුතුය :—

(i) 1973 ඔක්තෝබර් මස 12 වැනි දිනට වයස අවුරුදු 25 ට වැඩි විය යුතු අතර අවුරුදු 40 ට වැඩි නොවිය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත අයට මෙම වයස් සීමාව අදාළ නැත.

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වීම.

(iii) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාවන් අතින් ගෞරව උපාධියක් ලබා ඇති උපාධිධරයෙකු වීම, හෝ

(ආ) වර්ෂයකට රුපියල් 5,736 ට නොඅඩු වැටුපක් ලබමින්, එංගලන්ත රාජකීය සෞඛ්‍ය සමිතියේ සහතිකය දරණ, සෞඛ්‍ය අධ්‍යාපන විෂයයෙහි, යටත් පිරිසෙයින් එක් අවුරුදු විශ්ව විද්‍යාලීය පශ්චාත් උපාධි පාඨමාලාවක් සතුටුදායක ලෙස හදාරා සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ විශේෂඥත්වයක් ලැබූ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වීම.

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. අයදුම්කරුවන් සිය අයදුම්පත්වලට—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම පිළිබඳ සහතිකපත්, හා

(ආ) අයදුම්කරුගේ චරිතය හා මෙම තනතුර සඳහා ඇති සුදුසුකම් පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත් තුනක පිටපත් ඇමිණිය යුතුය. (මෙම අනුච්ඡේදය යටතේ දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

(ඇ) උප්පැන්න සහතිකයේ පිටපතක්.

7. අයදුම්පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 500, කොළඹ, යන ලිපිනයට ලේඛනගත තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. මගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවෙන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ජී. අමරසේන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹ 1, තැ. පෙ. 500,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දීය.

**ආදර්ශ ආකෘති පත්‍රය**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සහකාර සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
(අ) පෙළපත් නම :————.
(ආ) අනෙක් නම් :————.
2. ලිපිනය :————.
3 (අ) උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
(ආ) 1973. 10. 12 දිනට නියමිත වයස—
අවු :—— මාස :—— දින :——.
4. පුරවැසි බව හා එය ලබාගත් අන්දම :————.
5. අයදුම්කරු විවාහකද අවිවාහකද හෝ වැන්දඹුද යන වග :————.
6. (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.
(ආ) වෘත්තීය අධ්‍යාපනය සඳහා :————.
(ඉගෙනීම ලත් පාසල් හා විද්‍යාල, ඒවාට ඇතුළත් වූ හා අස්වූ දිනයන් සමග)
7. අධ්‍යාපන සුදුසුකම් (අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි) :————

8. ලබා ඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම් යමක් ඇතොත් දින සමග (පිළිගත් ආයතනවල හා වෘත්තීය සංස්ථාවන්හි සාමාජිකත්වය හෝ වෙනත් සුදුසුකම් ඇතොත් සඳහන් කරන්න) :————.

9. (1) පාසල හෝ විද්‍යාව හැරයාමෙන් පසු රක්ෂා, නියුක්තව සිටි හා හැරගිය දින සමග :————.

(2) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු නම්—

(අ) දරණ තනතුර :————.

(ආ) ශ්‍රේණියක් ඇතොත් එය :————.

(ඇ) දැනට ලබන වාර්ෂික වැටුප :————.

(ඈ) රාජකීය සෞඛ්‍ය සංගමයේ සහතික ලබා ඇත්ද යන වග :————.

10. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හා පළපුරුදුකම් : ————.

11. සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වය (දැනට රාජ්‍ය සේවාවෙහි සිටින්නවුන් සඳහා) :————.

12. ඔබ ගැන කරුණු දැනගැනීමට හැකි අයවලුන් දෙදෙනෙකුගේ නම්, ලිපිනය හා නිලතල :————.

13. චරිත සහතික පත් ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගල යින් දෙදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9-533 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව කොට්ඨාශයේ නිරල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධුරය**

ඉහත සඳහන් තනතුර සඳහා නිරල්ල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ විවාහක මුස්ලිම් පුරුෂ පක්ෂයෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන ප්‍රජා මණ්ඩල සමිති කාර්යාල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර කඩ සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානයන්හි ප්‍රදර්ශනය වන දැන්වීම්වල අඩංගු වේ.

3. සියළුම අයදුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර ඒවා 1973 ඔක්තෝබර් 20 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

සී. සී. ටී. පොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 සැප්තැම්බර් 05 වෙනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

9-463 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

**අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රාවස්තිපුර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ නුවරගම් පළාත කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය**

ශ්‍රාවස්තිපුර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සැහෙන දේපලක්ද, ගම්වාසීන්ගේ සැලකිල්ලද, අත්කරගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් අබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට නොඅඩු විය යුතුයි. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය, ග්‍රාම සේවක කාර්යාලය, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1973 ඔක්තෝබර් මස 31 වෙනි දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

එල්. බී. ඩී. ජයසේන,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1973 සැප්තැම්බර් මස 05 දින,
අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

9-536 —73. 09. 21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/2/237 (1).

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ඊජිප්තු අරාබි සමූහාණ්ඩු රජය මගින් ප්‍රදානය කරන ශිෂ්‍යත්ව 1973-74

ඊජිප්තු අරාබි සමූහාණ්ඩු රජය විසින් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනය සඳහා පරනමන පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

(1) අරාබි භාෂාව හා සාහිත්‍යය (අවුරුදු 3-4 දක්වා)

(2) වෛද්‍ය විද්‍යාව (අවුරුදු 7-8 දක්වා)

(3) කෘෂිකර්මය (පළතුරු වැවීම, පළතුරු පිත් කිරීම හා ආරක්ෂා කිරීම විශේෂ කොට) (අවුරුදු 4-5 දක්වා)

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514, හා 1969. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවක යින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් 1 වන ඡේදය මෙනි. (දීර්ඝ කිරීමට ඉඩ තිබේ.)

එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඊජිප්තු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1972.12.31 වැනි දිනට, වයස අවුරුදු 25 ට අඩුවිය යුතුයි.

මෙම තනතුරුවල පුරප්පාඩු පවත්නා ඒ ඒ අධ්‍යාපන දිස්ත්‍රික්කය භාර ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්/ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන් ගේ ලිපිනයන් පහතින් දක්වේ. දළ වශයෙන් ඒ ඒ අධ්‍යාපන දිස්ත්‍රික්කයන් හි පවතින ඇබෑර්තු සංඛ්‍යාවද ඉදිරියෙන් දක්වා ඇත. මෙම ඇබෑර්තු සියල්ලම හෝ ඉන් කොටසක් හෝ නොපුරවා සිටීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය සතුය.

| අධ්‍යාපනික දිස්ත්‍රික්කය | | අධ්‍යාපනික දිස්ත්‍රික්කය භාර ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන්ගේ ලිපිනය | | පවතින ඇබෑර්තු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මාතර | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මාතර ... | ... | 12 |
| කෑගල්ල | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, තංගල්ල | ... | 12 |
| රත්නපුර | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, රත්නපුර ... | ... | 20 |
| කෑගල්ල | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කෑගල්ල | ... | 18 |
| මාතලේ | ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මාතලේ ... | ... | 11 |
| නුවරඑළිය | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නුවරඑළිය | ... | 23 |
| බණ්ඩාරවෙල | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල | ... | 16 |
| මොණරාගල | ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මොණරාගල ... | ... | 6 |
| හලාවත | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, හලාවත | ... | 17 |
| අනුරාධපුර | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුර | ... | 23 |
| පොළොන්නරුව | ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, පොළොන්නරුව ... | ... | 07 |
| වවුනියාව | ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, වවුනියාව ... | ... | 02 |
| මන්නාරම | ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, මන්නාරම ... | ... | 07 |
| මඩකලපුව | ... | ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මඩකලපුව | ... | 04 |
| අම්පාර | ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, අම්පාර ... | ... | 05 |
| ත්‍රිකුණාමලය | ... | ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, අධ්‍යාපන කාර්යාලය, ත්‍රිකුණාමලය ... | ... | 12 |

**සටහන I.**—අයදුම්කරුවෙකු විසින් යැවිය යුත්තේ එක් අයදුම් පත්‍රයක් පමණි. එක් අයදුම්කරුවකු විසින් තවත් අයදුම්පත්‍ර අනෙකුත් ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හෝ ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන් හෝ වෙත යැවීම මෙම තනතුරක් සඳහා නුසුදුසු කමක් වන්නේය.

**සටහන II.**—පිටරටවල අයදුම්කරුවන්ට, තම අයදුම්පත්‍ර අදාළ ප්‍රාදේශිය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරී, වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාර දීමට සිය අභිමතය පරිදි පිළිවන.

**සටහන III.—වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු .**—ශ්‍රී ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු විසින් පැවැත්වෙන පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, එසේම ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා වැයවන යානපත්‍ර වියදමත්, එම නිලධාරීන් විසින් ම ගෙවිය යුතුය.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ කොන්දේසි.**—(අ) මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. පත්වීම අර්ථසාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. නමුත්, 1971.12.31 දින දක්වා රජයේ ස්ථිර සේවයෙහි යෙදී සිටි, දැනටමත් රජයේ ස්ථිර සේවයෙහි නියුක්තව සිටින, විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ පත්වීම් ලැබූ නිලධාරීන් එම අයිතිවාසිකම් තවදුරටත්, භුක්ති විඳිනු ඇත.

(ආ) තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම් මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කරනු ඇත. රාජ්‍ය සේවයෙහි නියුතු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම එක් අවුරුදු කාලපරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත. තනතුරෙහි ස්ථිර කිරීමේ දී ශ්‍රේණියට උසස්වීම ලැබූ දින පටන් ඔවුන් නියමිත වැටුප් ක්‍රමයෙහි ආයතන සංග්‍රහයේ කොන්දේසි අනුව පිහිටුවනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේය : අවුරුද්දකට රු. 6,024 න් පටන්ගෙන රු. 144 වාර්ෂික වර්ධක හතරකින් ද, රු. 180 ක වර්ධක අටකින්ද, රු, 240 වර්ධක හතරකින් ද රු. 9,000 දක්වා වැඩිවේ. නියමිත ප්‍රමාණයට අනුව විවාහක දීමනා ගෙවනු ලැබේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) 1973 ඔක්තෝබර් මස 13 දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට ඉහළ වයස්සීමාව අදාළ නොවේ.)

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ඇ) (I) 1968.05.01 දිනට ප්‍රථම පුහුණු උපාධිධාරියෙකු වශයෙන් සලකනු ලැබූ අයකු හෝ අධ්‍යාපන ඩිප්ලෝමා සමත් උපාධිධරයෙකු හෝ සමාන සහතික දරන්නකු හෝ ;

(II) පිළිගත් විශ්වවිද්‍යාලයක 1 වන හෝ 2 වන පෙළ ගෞරව උපාධියක් දරණ උපාධිධරයෙකු හෝ සමාන සහතික දරන්නකු හෝ ;

(III) උපාධිය ලැබීමෙන් පසුව, යටත් පිරිසෙයින් වර්ෂ තුනක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධරයෙකු හෝ සමාන සහතික දරන්නකු හෝ;

(IV) පුහුණුවෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ඉගැන්වීමේ පළ පුරුද්දක් ඇති ද්විතියක පුහුණු ගුරුවරයෙකු හෝ ;

(V) යටත් පිරිසෙයින් අවුරුදු 12 ක ඉගැන්වීමේ පළ පුරුද්දක් ඇති ද්විතියික/සිංහල/දෙමළ පළමුවැනි පෙළ පුහුණු සහතිකය දරණ ගුරුවරයෙකු හෝ ;

(VI) III වැනි ශ්‍රෙණියේ විදුහල්පතිවරයෙකු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති III වැනි ශ්‍රෙණියේ විදුහල්පතිවරයකු හෝ ;

(VII) III වැනි ශ්‍රෙණියේ විශේෂ තනතුරුධාරියෙකු වශයෙන් අවුරුදු 10 ක සේවයක් ඇති III වැනි ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරියෙකු හෝ ; විය යුතුය.

**සටහන I.**—මෙහි 1968 05.01 දිනට පෙර පුහුණු උපාධිධරයකු වශයෙන් ගැනෙනුයේ :

(අ) උපාධියෙන් පසුව පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබාගත් අයකු හෝ ;

(ආ) පුහුණුවීමේ දී විශේෂ පුහුණුව ලැබූ විෂයයක් එක් විෂයයක් වශයෙන් ඇතිව, පුහුණුවෙන් පසු උපාධියක් ලබාගත් ද්විතියික පුහුණු ගුරුවර යෙකු හෝ වේ.

**සටහන II.**—මෙහි සඳහන් පුහුණු උපාධිධරයෙකු/උපාධිධරයකු/පුහුණු ගුරුවරයෙකු වශයෙන් සේවා කාල ගණන් ගැනීමේදී අධ්‍යයන නිවාඩු හා වැටුප් රහිත නිවාඩු කාලසීමා ගණන් ගනු නොලැබේ.

**සටහන III.**—අයදුම්කරුවන්ට සිංහල/දෙමළ පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යයෙන් සාමාර්ථයක් හෝ, ඊට සමාන වූ හෝ ඊට වඩා උසස් හෝ සාමාර්ථයක් කලින් ලබා නැතිනම්, පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලසීමාවක් ඇතුළත අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේ සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යයෙන් හෝ සාමාර්ථයක් ලබා ගත යුතුයි. සිංහල/දෙමළ සාමාර්ථය ලබා ගැනීම සඳහා අවුරුදු තුනට වැඩියෙන් ගතවන කාලය වැටුප් වැඩිවීම විලම්බනය කළ කාල සීමාවක් සේ සලකනු ලැබේ.

සටහන iv.—තෝරාගනු ලබන විශේෂ තනතුරුධාරීන් සාමාන්‍යයෙන් මහා විද්‍යාලවල නියෝජ්‍ය විදුහල්පතීන් වශයෙන් හා අංශ භාර ප්‍රධානීන් වශයෙන් පත්කර යවනු ලැබේ. අංශ භාර ප්‍රධානීන් වශයෙන් පත්කරනු ලබන විශේෂ තනතුරුධාරීන් පහත සඳහන් විෂය ක්ෂෙත්‍රයන් භාරව කටයුතු කරනවා ඇත :—

(i) භාෂාව හා ආගම.
(ii) ගණිතය හා විද්‍යාව.
(iii) සමාජ විද්‍යා විෂයයන් (ඉතිහාසය, භූගෝල විද්‍යාව, ආණ්ඩුක්‍රම, අර්ථ ශාස්ත්‍රය, ප්‍රජාචාරය ආදිය.)
(iv) කාර්මික, වාණිජ හා රසඥන විෂයයන්.

සටහන v.—උසස්වීම මත යම් විදුහලකට දෙනු ලබන පත්වීමක් නොපිළිගතහොත්, නිරායාසයෙන් ම එම පත්වීම අවලංගු වන බව සැළකිය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලිවලින් කිසිවක් හෝ සියල්ලට හෝ ඉදිරිපත් කරන ලෙස නියම කළ විටක අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපන්‍යාස පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාර ගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඈ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

(ඉ) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්. (රජයේ සේවයේ නියුක්තවූවන්ට අදාළ නොවේ).

සංලක්ෂ්‍යය—(i) ඉල්ලුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කළ නොහැකි වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. ඉල්ලුම් පත් සහ ඒ සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම අදාළ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්/ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ හෝ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තු/දිස්ත්‍රික්ක කාර්යාලවල හෝ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් වන්නාවූ ද රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූ ද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

පි. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ, සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

රජයේ සිංහල/දෙමළ/මුස්ලිම් මහා විද්‍යාලයන්හි II වැනි ශ්‍රේණියේ විශේෂ තනතුරු සඳහා අයදුම් පත්‍රය.
(අනවශ්‍ය කොටස් කපා හරින්න).

1. (අ) මුලකුරු සමඟ නම :————. හිමි/මහතා/මහත්මිය/මෙනෙවිය
(ආ) සම්පූර්ණ නම :————.

2. ලිපිනය : (i) (අ) පෞද්ගලික :———— (ii) ස්ථිර පදිංචිය අනුව අයත් ඡන්ද කොට්ඨාශය :————.
(ආ) රාජකාරී :————

3. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි අංකය :————.

4. පරම්පරාවෙන් ලාංකිකයෙක් ද, එසේ නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ලාංකිකද, යන බව :————.

5. ආගම :————.

6. උපන් දිනය :———අවුරුද්ද :———— මාසය :———— දිනය :————

7. 1973.10.13 දිනට වයස :—අවුරුදු————. මාස :———— දින :————.

8. විවාහක අවිවාහක බව :————.

9. විවාහක නම් (i) ස්වාමිපුරුෂයා/භාර්යාව රැකියාවක් කරයිද යන බව :————. (ii) රැකියාවක් කරයි නම් රැකියාව පිළිබඳ විස්තර :————.

10. ලබා ඇති අධ්‍යාපනික සුදුසුකම් :—
(i) (අ) උපාධිය :————. (ඇ) අවුරුද්ද :————.
(ආ) විශ්වවිද්‍යාලය :————. (ඈ) උපාධියේ පෙළ/පංතිය :————.
(ඉ) උපාධියට ගත් විෂයයන් :————.
(ii) පශ්චාත් උපාධි සුදුසුකම් පිළිබඳ විස්තර :————.
(iii) ගුරු පුහුණුව පිළිබඳ විස්තර :—
(අ) පුහුණුව ලැබූ ගුරුවිදුහල :————. (ඇ) සහතිකයේ අංකය සහ වලංගු දිනය :————.
(ආ) පුහුණුව ලැබූ කාලසීමාව :————. (ඈ) සහතිකයේ I වැනි පෙළට උසස් වූ දිනය :————.
(iv) වෙනත් සුදුසුකම් වෙතොත් ඒවා :————.

11. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :—
(අ) තනතුර :————.
(ආ) ස්ථිරද ? තාවකාලිකද ? ————.
(ඇ) විශ්‍රාම වැටුප් සහිත ද ? රහිතද ? :————.
(ඈ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටී ද ? :————.
(ඉ) සේවා ස්ථානය :————.
(ඊ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
(උ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප් පියවර :————.

12. පාසලින් අස්වූ දින සිට කරන ලද රැකියාව සහ/හෝ පුහුණුව පිළිබඳ විස්තර :————.
(මෙහි පහත දැක්වෙන ආකෘතියෙහි සඳහන් කළ යුතුය).

| ආයතනයේ/විදුහලේනම | සේවයට පැමිණි දිනය | අස්වූ/මාරු වූ දිනය | දරූ තනතුරු/ලැබූ පුහුණුව | සේවා කාලය | | | අස්වීමට/මාරුවීමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | | අවු. | මාස | දින | |
| | | | | | | | |

13. අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර හා කාලසීමාව :————.

14. සිංහල/දෙමළ පිළිබඳ ලබා ඇති උසස්ම සහතික පිළිබඳ විස්තර :————.

15. කිසියම් සාපරාධී ක්‍රියාවක් උඩ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා දඬුවම පිළිබඳ විස්තර :————.

16. රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේ ද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

17. වෙනත් විශේෂ කරුණු :————.

18. ගැසට් නිවේදනයේ 4 වැනි ඡේදයේ දී ඇති අධ්‍යාපනික සුදුසුකම් අතුරෙන් තමන් සුදුසුකම් ලබා ඇත්තේ කුමන උප ඡේදය යටතේද යන වග:————.

මෙම අයදුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව, මෙයින් සහතික කරමි. අයදුම් පත්‍රයක් වෙනත් ප්‍රදේශයකට යවා නැති බවත් මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු විමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–539—73.09.21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

රාජ්‍ය දැව සංස්ථාවේ සිංහරාජ යාන්ත්‍රික දැව කපා හෙළීමේ ව්‍යාපාරයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ

1. බස් රියදුරු :

වැටුප් ක්‍රමය.—රු. 310—රු. 10×9—රු. 400 (සියලු දීමනා සහිතව මසකට).

වයස.—1973.09.28 දිනට අවුරුදු 35 ට අඩුවිය යුතුය.

සුදුසුකම්.—කණිෂ්ඨ පාඨශාලා සහතිකය සමඟ සියළුම වර්ගවල බර යන්ත්‍ර හා/හෝ බර වාහන පැදවීමේ බලපත්‍රයක් සහ එම වාහන පැද වීමේ අවුරුදු 5 ක පළපුරුද්දක් සහ එම යන්ත්‍රවල/වාහනවල සුළු අළුත්වැඩියාවන් කිරීම, සර්විස් කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතුය.

2. කාර්මික සහ වැද්දුම්කරු :

වැටුප් ක්‍රමය.—රු. 310— රු. 10×9—රු. 400 (සියලු දීමනා සහිතව මසකට)

වයස.—1973.09.28 දිනට අවුරුදු 35 ට අඩුවිය යුතුය.

සුදුසුකම්.—කනිෂ්ඨ පාඨශාලා සහතිකය සමඟ පිළිගත් වැඩපලක ඔක්සි-ඇසිටිලීන් සහ විදුලිය වැද්දුම් පිළිබඳව අවුරුදු 10 ක පළපුරුද්දක් සහ සියළුම වර්ගවල බර යන්ත්‍ර පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුය.

3. වේලාව සටහන් කරන්නා :

වැටුප් ක්‍රමය.—රු. 350—රු. 15×4/රු. 20×10—රු. 610 (සියලු දීමනා සහිතව මසකට)

වයස.—1973.09.28 දිනට අවුරුදු 23 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

සුදුසුකම්.—(ඒ) ගණිතය ඇතුළුව විෂයයන් 4 කට සම්මාන සාමාර්ථය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙවරකට නොවැඩි වාරයකදී විෂයයන් 6ක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සහ පිරිවැය සහ කළමනාකාර ගණකාධිකරණය ආයතනයේ හෝ ලංඩනයේ සහතික ලත් හා ඒකාබද්ධ ගණකාධිකාරී ආයතනයේ හෝ ලියාපදිංචි වී සිටිය යුතුය.

(බී) අයදුම්කරුවන්ට ගණකාධිකරණ කටයුතු පිළිබඳ වගකිවයුතු තත්ත්වයක පළපුරුද්දක් තිබිය යුතු අතර, පිරිවැය ගණකාධිකාරී කටයුතු පිළිබඳ දැනීමක් සහිතව, සේවයට බඳවා ගැනීම සහ වැටුප් ගෙවීම පිළිබඳ රජයේ නීතිරීති සහ කම්කරු නීති පිළිබඳ දැනීමක් තිබිය යුතුය.

4. යාන්ත්‍රික බඩු ගබඩා පාලක :

වැටුප් ක්‍රමය.—රු. 350—රු. 15×4/රු. 20×10—රු. 610 (මසකට සියළු දීමනා සහිතව)

වයස.—1973.09.28 දිනට අවුරුදු 40 ට අඩුවිය යුතුය.

සුදුසුකම්.—ගණිතය ඇතුළු විෂයයන් 4 කට සම්මාන සාමාර්ථය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ දෙවරකට නොවැඩි වාරයකදී විෂයයන් 6 ක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමඟ පිළිගත් වැඩපොළක වර්ෂ දෙකක් පුහුණුවීමේ ආධුනික කාලයක් සහ අඩුම වශයෙන් පිළිගත් ආයතනයක යාන්ත්‍රික බඩු ගබඩා පාලක වරයෙකු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

5. බඩු ගබඩා පාලක :

වැටුප් ක්‍රමය.—රු. 350—රු. 15×4/රු. 20×10—රු. 610 (මසකට සියළු දීමනා සහිතව)

වයස.—1973.09.28 දිනට අවුරුදු 23 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

සුදුසුකම්.—ගණිතයට හෝ අංක ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 කින් ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සහ කාඩෙක්ස් ක්‍රමය හෝ ලෙජර් ගබඩා පාලන ක්‍රමය අනුව පිළිගත් ආයතනයක බඩු ගබඩා ක්‍රමය පිළිබඳ අවුරුදු 8 ක පළපුරුද්දක් තිබිය යුතුය.

පිරිවැය සහ කළමනාකරණය ගණකාධිකාරී ආයතනයේ හෝ ලංඩනයේ සහතික ලත් හා ඒකාබද්ධ ගණකාධිකාරී ආයතනයේ හෝ ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

6. බංගලා භාරකරු :

වැටුප් ක්‍රමය.—රු. 210—රු. 5×15—රු. 285 (මසකට සියලු දීමනා සහිතව)

වයස.—1973.09.28 දිනට අවුරුදු 45 ට අඩුවිය යුතුය.

සුදුසුකම්.—පිළිගත් හෝටලයක හෝ ආයතනයක පෙරදිග හා අපරදිග ආහාර පාන පිළියෙල කිරීම පිළිබඳ අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

7. සහකාර බංගලා භාරකරු :

වැටුප් ක්‍රමය.—රු. 200—රු. 5×11—රු. 255 (මසකට සියලු දීමනා සහිතව)

**වයස.**—1973.09.28 දිනට අවුරුදු 45 ට අඩුවිය යුතුය.

**සුදුසුකම්.**—පිළිගත් හෝටලයක හෝ ආයතනයක පෙරදිග හා අපරදිග ආහාර පාන පිළියෙල කිරීම පිළිබඳ අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**සේවා කොන්දේසි හා බඳවා ගැනීමේ කොන්දේසි.**—

**1.** මෙම තනතුරු තාවකාලික තනතුරු වන අතර තෝරා ගනු ලබන අයදුම්කරුවන් අවුරුද්දක පරීක්ෂණාත්මක කාලයකට යටත් වනු ඇත. වැටුපෙන් 6% ක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. සිංහරාජ යාන්ත්‍රික දැව කපාහෙලීමේ ව්‍යාපාරය මගින් සිය සහභාගය වශයෙන් 9% ක් ගෙවනු ලැබේ.

2. තෝරා ගනු ලබන අයදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය සහ විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තීන්ගේ අනුකූලතාවයන් ක්‍රියාත්මක කිරීමෙහිලා දැනටමත් පනවා ඇති නීති හෝ ඉදිරියට පනවනු ලබන නියමයන් ද පිළිපැදීම අපේක්ෂා කෙරේ.

**3.** තෝරාගත් අයදුම්කරුවන් රාජ්‍ය දැව සංස්ථාවේ සිංහරාජ යාන්ත්‍රික දැව කපාහෙලීමේ ව්‍යාපාරයේ සේවකයින්ට බලපාන පොදු සේවා කොන්දේසි වලට යටත්වනු ඇත.

4. තෝරා ගනු ලබන අයදුම්කරුවන් සිංහරාජ වනයේ කඳවුරු වල නැවතීම අපේක්ෂා කෙරේ.

**ඉල්ලුම් පත් :**

සුදුසුකම්, පළපුරුද්ද යනාදිය විස්තරාත්මකව සඳහන් කර, අයදුම් පත් කොළඹ 5, වජිර පටුමගෙහි අංක 7 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති වෙත 1973.09.28 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඉල්ලුම්කර ඇති තනතුර ලියුම් කවරයේ වම් උඩු කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම් පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

7, වජිර පටුමග,
කොළඹ 5, 1973.09.11.

9-564—73.09.21 දින අංක 78 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : සාප/22/236.

අධ්‍යාපන අමාත්‍යාංශය

නිෂ්පාදන කළමනාකාර තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පත්තල ගෙදර විද්‍යා උපකරණ නිෂ්පාදන ඒකකයේ නිෂ්පාදන කළමනාකාර තනතුර සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, ඉල්ලුම් පත් පිළියෙල කොට, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත පහත සඳහන් දිනයට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම් පත් බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "නිෂ්පාදන කළමනාකාර තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

(අ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1973. 10. 22 දින

(ආ) විදේශ ඉල්ලුම් පත්‍ර : 1973. 11. 05 දින

(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල සිටින ලාංකික අයදුම්කරුවන්ට තම ඉල්ලුම්පත්‍ර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවීම සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත් කර සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව තුළදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රුපියල් 8,160න් පටන්ගෙන රුපියල් 360 බැගින්වූ වැටුප් වැඩිවීම් 8කින් හා රුපියල් 480 බැගින්වූ වැටුප් වැඩිවීම් 2කින් යුතුව රු. 12,000 දක්වා වැඩිවන වාර්ෂික ඒකාබද්ධ වැටුපක් මෙම තනතුරට හිමිවේ. රුපියල් 11,040 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද සහිතයි.

**සටහන :** (1969. 10. 1 වැනි දිනට පෙර මෙම වැටුප් පරිමාණයට අනුරූපව පැවැති මූලික වැටුප් පරිමාණය රුපියල් 5,520—8×360—2×480—රු. 9,360 වේ.)

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි.**—

(i) තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකවනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් රජයේ සේවයේ නියුක්ත නැති නම්, මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත්කරනු ඇත. රාජ්‍ය සේවයේ නියැලි ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(ii) අයදුම්කරුවන් තවදුරටත් සේවයෙහි යෙදවීමට නුසුදුසු බව ආධුනික කාලසීමාව ඇතුළත හැඟී ගියහොත්, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු නම්, ආධුනික කාල සීමාව ඇතුළත හෝ එම කාලසීමාව අවසානයේ කලින් දැරූ තනතුරට නැවත පත්කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙකු නොවේ නම්, සේවය නතර කරනවා ඇත.

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින්මතු පනවන ව්‍යවස්ථාවලටද තෝරා පත්කර ගනු ලැබූවන් අනුකූල විය යුතුය.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ලබා තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන් සඳහා උපරිම වයස් සීමාව නො යෙදේ.)

(ii) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයකින් යුක්ත වීම.

(iii) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්.**—(i) (අ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු උපාධියක් හෝ ලංකා කාර්මික විද්‍යාලයේ හෝ එවැනි පිළිගත් ආයතනයක ඉංජිනේරු ඩිප්ලෝමා උපාධියක් හෝ සමාන ඉංජිනේරු උපාධියක් සහ පහත සඳහන් විශේෂ සුදුසුකම් තිබිය යුතුය :—

(ii) **විශේෂ සුදුසුකම්.**—(ආ) උපකරණ භාවිතය අත්‍යවශ්‍යවන පාසල් විෂයයන් ඉගැන්වීම පිළිබඳ අවුරුදු පහකට නොඅඩු පළපුරුද්දක් සහ එම විෂයයන් පිළිබඳ සමීක්ෂකයෙකු වශයෙන් අවුරුදු 5කට නො අඩු පළපුරුද්දක් සහ,

(ඉ) උපකරණ භාවිතය අත්‍යාවශ්‍ය වන පාසල් විෂයයන් පිළිබඳ විෂයමාලා සංවර්ධන වැඩ පිළිබඳ එක් අවුරුද්දකට නො අඩු පළපුරුද්දක්.

(iii) **අතිරේක සුදුසුකම්.**—ඉහත සඳහන් සුදුසුකම් වලට අමතර වශයෙන් පහත සඳහන් අතිරේක සුදුසුකම් ඇති අපේක්ෂකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ :—

(අ) ඉගැන්වීම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ සම්බන්ධයෙන් හා එවැනි උපකරණ නිෂ්පාදනය කිරීම් හා වැඩි දියුණු කිරීම් සම්බන්ධව අවුරුද්දකට නොඅඩු නිත්‍ය පළපුරුද්දක්.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් විදේශ ආයතනයක කර්මාන්තශාලා පිළිබඳ යටත් පිරිසෙයින් තුන් මසක විදේශ පුහුණුවක්.

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත 1 ඡේදයේ සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු

නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනයට පෙර ලැබී ප්‍රමාදය පිළිබඳව සැලකියයුතු කරුණු ඔහු විසින් ඉදිරිපත් කළහොත් පමණක්, ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද, සෑම අයදුම්කරුවෙකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙළින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත්වලට අමුණා එවිය යුතුය :—

(අ) **උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික හෝ පාඨශාලාවන්ට ඇතුළුවීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)**

(ආ) **අධ්‍යාපන සහතික.**

(ඉ) වෘත්තීය/කාර්මික සහතික.

(ඊ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක් ද, (දැනට රජයේ ස්ථිර සේවයේ සිටින අයදුම්කරුවන් විසින් මේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. අයදුම්පත් හා ඊට අදාල වෙනත් ලිපි මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල ලිපිනයට හැර කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි කෙරෙහි ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව දින 14ක් ගෙවුණු කල, අයදුම්පත ලද බවට දන්වීමක් නොලද හොත් ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත වහාම දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාව පැහැර හැරියහොත්, තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

**අධ්‍යාපන අමාත්‍යාංශයේ පන්නලගෙදර විද්‍යා උපකරණ ඒකකයේ නිෂ්පාදන කළමනාකාර තනතුර**

1. නම (මුලකුරු සහිතව) :————. මහතා/මහත්මිය/මෙනවිය.

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
   (ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන් ද? :————.

6. උපන් දිනය : අවුරුද්ද :——, මාසය :——, දිනය :——.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස : අවුරුදු :——, මාස :——, දින :——.

8. දැනට දරණ තනතුර පිළිබඳ විස්තර :—

(අ) තනතුර :————.

(ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.

(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.

(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.

(උ) දෙපාර්තමේන්තුව :————.

(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.

(ඔ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.

(ඕ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| 1. ........ | ........ | ........ |
| 2. ........ | ........ | ........ |
| 3. ........ | ........ | ........ |

10. වෘත්තීය/කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. ........ | ........ | ........ | ........ |
| 2. ........ | ........ | ........ | ........ |
| 3. ........ | ........ | ........ | ........ |
| 4. ........ | ........ | ........ | ........ |
| 5. ........ | ........ | ........ | ........ |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතනය.

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. ........ | ........ | ........ | ........ |
| 2. ........ | ........ | ........ | ........ |
| 3. ........ | ........ | ........ | ........ |
| 4. ........ | ........ | ........ | ........ |
| 5. ........ | ........ | ........ | ........ |
| 6. ........ | ........ | ........ | ........ |

12. වෘත්තීය/කාර්මික අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| 1. ........ | ........ | ........ | ........ |
| 2. ........ | ........ | ........ | ........ |
| 3. ........ | ........ | ........ | ........ |
| 4. ........ | ........ | ........ | ........ |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න) :—

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| 1. ........ | ........ | ........ | ........ | ........ | ........ |
| 2. ........ | ........ | ........ | ........ | ........ | ........ |
| 3 ........ | ........ | ........ | ........ | ........ | ........ |
| 4. ........ | ........ | ........ | ........ | ........ | ........ |

14. අතිරේක සුදුසුකම් පිළිබඳ විස්තර

| සේවය කළ ආයතනයේ/ පුහුණුවූ ආයතනයේ නම | කරන ලද සේවයේ/ලැබූ පුහුණුවේ ස්වභාවය | සේවය කළ/පුහුණුවූ කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| 1. ...................... | ...................... | ........... | ........... |
| 2. ...................... | ...................... | ........... | ........... |
| 3. ...................... | ...................... | ........... | ........... |

15. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරුවී ඇත්තේ ද? (එසේ නම් විස්තර දක්වන්න)

16. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද? (එසේ නම් විස්තර දක්වන්න)

17. ඔබ මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නොවේනම් ඔබේ නයතුරුස්වල ප්‍රමාණය කොපමණ ද?

18. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–532—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සාප/3/440.

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උපදේශක තනතුරු සඳහා පුහුණුවන උපදේශකයින් බඳවා ගැනීම**

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උපදේශක තනතුරු සඳහා පුහුණුවන උපදේශකයින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ ඉල්ලුම් පත්‍ර 1973.10.13 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලේකම්, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) අධ්‍යාපන අමාත්‍යාංශය, මැලේ වීදිය, කොළඹ 2 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය :—

2. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට මෙහි පහත පස්වැනි ඡේදයේ දක්වෙන වෘත්තීන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන්, කටුබැද්ද කාර්මික ගුරුවරුන් පුහුණු කිරීමේ අංශයේ එක් අවුරුදු පුහුණුවක් දෙනු ලැබේ.

3. කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උපදේශක තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රුපියල් 6,024 වාර්ෂික වැටුපෙන් පටන් ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් සහ රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් රු. 8,040 දක්වා වැඩිවන ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමයක් මේ තනතුරුවලට අයත් වේ. (69.10.01 දිනට පෙර මීට අනුරූපව පැවති වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4 හා 180 × 8—රු. 5,340 වේ.)

**සටහන.**—විදුලිය වෘත්තිය පුහුණුවන්නන් සඳහා පමණක් සිංහල/දෙමළ මාධ්‍යයෙන් පුහුණුවන උපදේශක පුරප්පාඩු ඇත. අනිකුත් විෂයයන් සඳහා පුහුණුවන උපදේශක පුරප්පාඩු ඇත්තේ සිංහල මාධ්‍යයෙන් පුහුණු වන්නන් සඳහා පමණකි.

4. පුහුණු කිරීම සඳහා බඳවා ගනු ලබන අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික, වෘත්තිය හා වෙනත් සුදුසුකම් මෙසේය :—

(i) 1973.10.13 වැනි දිනට වයස අවුරුදු 19ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් හෝ,

(ඇ) සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

සහ

(iv) (අ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ හෝ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ හෝ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු සහතිකය හෝ,

(ඇ) හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය, හෝ

(ඈ) ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (සිවිල්) සහතිකය, හෝ

(ඉ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ සන්ධ්‍යා හෝ අර්ධකාලීන පාඨමාලා සහතිකය, හෝ

(ඊ) හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ සිවිල් ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ,

(උ) ලංකා කාර්මික විද්‍යාලයේ තුන් අවුරුදු සන්ධ්‍යා විදුලි ඉංජිනේරු සහතිකය, හෝ

(ඌ) මෙම උප ඡේදයේ (අ) සිට (උ) දක්වා සඳහන් සුදුසුකම් වලට සමාන හෝ උසස් තත්ත්වයෙහි ලා සැලකෙන දේශීය හෝ විදේශීය පිළිගත් කාර්මික අධ්‍යාපන ආයතනයකින් ලබා ගන්නා ලද මෙහි පහත "5" වැනි ඡේදයේ දක්වා ඇති පාඨ මාලාවන් සඳහා පුහුණු කිරීමට යෝග්‍ය කාර්මික සුදුසුකම් ලබා තිබිය යුතුය.

(v) ඉහත සඳහන් අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම්වලට අමතර, සෑහෙන පළපුරුද්දක් ලබා ඇති අය කෙරේ විශේෂ සැලකිලි දක්වනු ලැබේ.

**සටහන.**—කිසිම පළපුරුද්දක් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ යට කැඳවනු නොලැබේ.

5. **පුහුණුවන කාලය සඳහා දීමනා.**—රුපියල් 400 කට වැඩි නොවන නියමිත මාසික දීමනාවක් ගෙවනු ලැබේ. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයෙකු තෝරා ගැනීමේදී ඔහුට ගෙවිය යුතු වැටුප් ආයතන අධ්‍යක්ෂ ගේ නිරීක්ෂණ යටතේ තීරණය කෙරෙනු ඇත.)

කාර්මික අධ්‍යාපන ආයතනයන්ගේ අවශ්‍යතාවයේ හැටියට පහත සඳහන් වෘත්තීන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක පුහුණුවක් ලබා දීමට මෙකී පුහුණුවන්නන් බඳවා ගනු ලැබේ :—

(i) ලී භාණ්ඩ සෑදීම, වඩු වැඩ සහ පිරිද්දුම්වැඩ ආදියේ විශේෂ නිපුණත්වයක් සහිතව ලී වැඩ සඳහා,

(ii) වෑද්දුම් වැඩ, යන්ත්‍ර වැඩ, වාත්තු වැඩ, ලෝහ තහඩු වැඩ ආදියෙහි විශේෂ නිපුනත්වයක් ඇතිව ලෝහ වැඩ සඳහා,

(iii) ගෘහස්ථ විදුලි කම්බි සවි කිරීම, විදුලි ස්ථාපනය, ආලෝක ක්‍රම ශීතකරණය, වායු සමනය, ගුවන් විදුලි අළුත්වැඩියා කිරීම ආදිය ඇතුළත්ව විදුලි ශිල්පය සඳහා,

(iv) ස්වයංචල යාන්ත්‍රික, ට්‍රැක්ටර් යාන්ත්‍රික විද්‍යාව, ආදිය සඳහා,

(v) පෙදරේරු වැඩ හා ගඩොල් බැඳීමේ විශේෂ නිපුනත්වයක් සහිතව ගොඩනැගිලි වෘත්තිය සඳහා,

(vi) කාර්මික චිත්‍ර සඳහා.

6. පුහුණු කිරීම සඳහා බඳවා ගනු ලබන පුහුණුවන උපදේශකයින්ට අදාල කොන්දේසි :—

(අ) පුහුණු කිරීමට බඳවා ගනු ලබන්නවුන් සඳහා රජය විසින් නියම කරනු ලබන පාඨමාලාවක් සතුටුදායක අයුරින් සම්පූර්ණ කළ යුතු අතර, එකී පාඨමාලාව අවසානයේ දී නියම කරනු ලබන ප්‍රවීණත්වයක් ලැබිය යුතු වන්නේය.

(ආ) (i) නියමිත පාඨමාලාව පුහුණුවීමේ කාලය තුලදී සතුටුදායක අයුරින් සම්පූර්ණ කිරීමට හා ඊට පසුව රජය විසින් නියම කරනු ලබන කාල සීමාවක් අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කිරීමට භාර ගනිමින්, ශ්‍රී ලංකාණ්ඩුවත් සමඟ ගිවිසුමකට බැඳිය යුතුය.

(ii) ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්, පුහුණුව සඳහා වන සම්පූර්ණ වියදම් ආපසු ගෙවන බවට ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු මහතකු ඉදිරිපිට දී පුහුණුව සඳහා තෝරා ගනු ලබන අය ඇපකරුවන් දෙදෙනෙකුත් සමඟ අත්සන් කරනු ලබන බැඳුම්කරයකට ඇතුළත් වීම අවශ්‍ය වේ.

(ඉ) (i) පුහුණුව සාර්ථක අයුරින් සම්පූර්ණ කරන ලද බවටත්, ඉන් අනතුරුව නියමිත ප්‍රවීණතා තත්ත්වය ලැබූ බවටත්, හා ස්ථිර උපදේශක තනතුරකට පත් කිරීම සඳහා යෝග්‍ය බවටත්, අදල අධිකාරීන් විසින් දෙනු ලබන සහතිකය පදනම්ව, කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උපදේශක තනතුරු ඇබෑර්තු ඇතිවන අයුරින් පුහුණු කරවන ලද්දවුන් ස්ථිර උපදේශකවරුන් හැටියට කාර්මික අධ්‍යාපන ආයතනයන්ට පත් කෙරේ.

(ii) පුහුණු කරවන ලද උපදේශකයින් ස්ථිර උපදේශක තනතුරු වලට පත් කිරීමේ දී ඔවුන්ගේ පුහුණුවීමේ කාලය, ස්ථිර උපදේශක තනතුරු සඳහා තිබිය යුතු පස් අවුරුදු ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ කාල සීමාවෙන් අඩු කර, පස් අවුරුදු පළපුරුද්ද ලබන තුරු ඉතිරි කාල පරිච්ඡේදය තනතුරු සඳහා නියමිත ආරම්භක වැටුපෙහි පිහිටුවා පත් කරනු ලැබේ.

සටහන.—(i) පුහුණුවීම සඳහා ඇතුළත් වීමට පෙර ගණන් ගත හැකි කිසියම් පළපුරුද්දක් වේ නම් එකී කාල සීමාව ද ස්ථිර උපදේශක තනතුරට පත් කිරීමේ දී පළපුරුද්ද වශයෙන් ගණන් ගනු ලැබේ.

(ii) පුහුණු කරවන උපදේශකයින් ස්ථිර උපදේශක තනතුරුවලට පත් කිරීමේදී එක් එක් උපදේශක තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටි යටතේ අදාල සුදුසුකම් සපුරා තිබිය යුතුය.

7. රජයේ සේවයේ නියුතු සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී, ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කර නිර්දේශ කළහොත් පමණකි, යථොක්ත ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලබන්නේ.

8. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියකියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකාන පාසලට පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සහ වෘත්තිය සහතිකය.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව මෑතදී ලබා ගත් චරිත සහතික තුනක්.

සැලකිය යුතුයි.—දනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනු ඡෙදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (IIඅ) වැනි අනු ඡෙදයේ පටන් ගැන්මෙහි පළකර තිබෙන රජයේ තනතුරු සඳහා පත් කිරීම්වලට අදල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 2, මාලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දිය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය—අධ්‍යාපන අමාත්‍යාංශය

( අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසිවල සකස් කළ යුතුය.)

**කාර්මික අධ්‍යාපන ආයතනයන්හි උපදේශක තනතුරු සඳහා පුහුණු වන උපදේශකයින් බඳවා ගැනීම**

(සාප/3/440)

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————.
මහතා/මහත්මිය/මෙනවිය.

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

3. ජාතිය :————.

(ලාංකිකවන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයක් සඳහන් කරන්න.)

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :———— මාස :———— දින :————.
(ආ) උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :———— දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න).

5. උපන් ස්ථානය :
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇයගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
(ආ) විවාහකනම්, විවාහ වූ දිනය සහ ළමයි ගණන සඳහන් කරන්න :
————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමග :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

9. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය සඳහා නිපුණතාවක් තිබේද ? :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

10. ලබාගෙන ඇති වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දිනය හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

11. විශේෂ සුදුසුකම් :—
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේද ? එසේනම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේනම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි. දනටමත් රජයේ සේවයේ යෙදී සිටිනම්, මේ අවශ්‍ය නැත) :————.

16. සේවා මුක්ත භටයෙක් නම්, (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකිරක්ෂා :—
(i) ආයතනවල නම් :————.
(ii) දරන ලද තනතුර :————.
(iii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iv) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දනට යෙදී සිටින රක්ෂාව :—
(i) ආයතනයේ නම :————.
(ii) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(iii) විශ්‍රාම වැටුප් සහිතද? තාවකාලික හෝ අනියමද? :————.

(iv) (දීමනා රහිතව) දැනට ලබන වාර්ෂික වැටුප් හා වැටුප් ක්‍රමය (ඒකාබද්ධ වැටුප් ලබන්නේ නම් දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප් හා වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය සඳහන් කරන්න :————.

(v) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

(vi) දැනට නියුක්ත තනතුරේ සේවය ස්ථිර කර තිබේද යන වග : ————.

(සේවය ස්ථිර කර තිබේ නම් එම ලිපියේ පිටපතක් අමුණන්න).

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත් නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–541—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප/3/441.

**අධ්‍යාපන අමාත්‍යාංශය**

වාණිජ විද්‍යා පිළිබඳ උපදේශක තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතන යන්හි වාණිජ විද්‍යා පිළිබඳ උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළයුතු අයදුම්පත් 1973 10. 13 දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ උඩ වම් කෙළවරේ " වාණිජ විද්‍යා පිළිබඳ උපදේශක තනතුරු " යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. පත් කරනු ලබන අය විසින් තමාගේ වැටුපෙන් සියයට 6 ක් අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් වශයෙන් ගෙවිය යුතු අතර, රජය විසින් සියයට 9 ක් ඒ සඳහා ගෙවනු ඇත. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු පරිවාස කාලසීමාවකට යටත් වේ.

ගනු ලැබුවහොත් ඔහුගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා ගනු ලැබුවහොත් ඔහුගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන අතර පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වන්නේ ය.

3. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම, පහත දැක්වෙන සුදුසුකම් ලබා සිටින බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1973. 10. 13 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හෝ 40 ට නොවැඩි බව, (දැනටමත් රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) පහත දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් අතරින් එකක් ඇති බව :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, හෝ

(ආ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළු විෂයයන් 6 කින් ලද (සාමාන්‍ය පෙළ) අධ්‍යයන පොදු සහතික පත්‍රය, හෝ

(ඉ) ඊට සමාන හෝ උසස් විභාගයකින් ලද සාමාර්ථය.

(iv) පහත දැක්වෙන වෘත්තීය සුදුසුකම් අතරින් යටත් පිරිසෙයින් එකක්වත් ලබා සිටින බව :—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් වාණිජ විද්‍යාව හෝ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ උපාධිය, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ්‍ය පිළිබඳ හෝ ගණක ශාස්ත්‍රය පිළිබඳ හෝ ඩිප්ලෝමා සහතිකය, හෝ

(ඉ) බ්‍රිතාන්‍ය වාණිජ ගුරු සහතිකය හෝ සමාන සුදුසුකම් සහ අවුරුදු 15 ක ප්‍රායෝගික/ඉගැන්වීමේ පළපුරුද්ද, හෝ

(ඊ) සමාන සුදුසුකම්.

සටහන.—ඉගැන්වීමේ සහ/හෝ ප්‍රායෝගික පළපුරුද්ද ලත් අය කෙරෙහි වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(v) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ඇති බව. නැතහොත්, පත්වීම ලැබී අවුරුදු 3 ක් ඇතුලත සිංහලෙන් ඉගැන්වීමට ප්‍රවීණත්වයක් ලබා ගැනීමට හැකියාව තිබෙන බව.

4. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 6,024—4×144 සහ 8×180—රු. 8,040 වේ. රු. 6,780 සහ රු. 7,500 වාර්ෂික ඒකාබද්ධ වැටුප් පියවරවල් ඉක්මවා යාමට පෙර කාර්යක්ෂමතා කඩඉම් වලින් සමත් විය යුතුය. (1969. 10. 01 ට පෙර මීට අනුරූපව පැවති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—4×120 සහ 8×180 රු. 5,340 විය.).

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත 1 ඡේදයේ සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනයට පෙර ලැබී ප්‍රමාදය පිළිබඳව සැලකිය යුතු කරුණු ඔහු විසින් ඉදිරිපත් කළහොත් පමණක්, ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද, සෑම අයදුම්කරුවකු විසින්ම තම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙළින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පත් වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික හෝ පාඨශාලා වන්ට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික.

(ඉ) වෘත්තීය/කාර්මික සහතික.

(ඊ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 2 ක් (දැනට රජයේ ස්ථිර සේවයේ සිටින අයදුම්කරුවන් විසින් මේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. අයදුම්පත් හා ඊට අදාළ වෙනත් ලිපි මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල ලිපිනයට හැර කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි කෙරෙහිද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පසු වී දින 14 ක් ගෙවුණු කල, අයදුම්පත ලද බවට දැන්වීමක් නොලද හොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත වහාම දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියහොත්, තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දී ය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

**අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයන්හි වාණිජ විද්‍යා පිළිබඳ උපදේශක තනතුර**

1. නම (මුලකුර සහිතව) :————.
මහතා/මහත්මිය/මෙනවිය

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.

(ආ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද ? : ————.

6. උපන් දිනය : අවුරුද්ද :——, මාසය :——, දිනය :——.

7. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට වයස :————.
අවුරුදු :——, මාස :——, දින :——.

8. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—

(අ) තනතුර :———.
(ආ) ස්ථිරද, තාවකාලිකද ? :———.
(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද :———.
(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :———.
(උ) දෙපාර්තමේන්තුව :———.
(ඌ) ආයතනය/සේවා ස්ථානය :———.
(ඔ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :——— .
(ඕ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටු. :———.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| 1. ........ | | |
| 2. ........ | | |
| 3. ........ | | |

10. වෘත්තිය/කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. ........ | | | |
| 2. ........ | | | |
| 3. ........ | | | |
| 4. ........ | | | |
| 5. ........ | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. ........ | | | |
| 2. ........ | | | |
| 3. ........ | | | |
| 4. ........ | | | |
| 5. ........ | | | |
| 6. ........ | | | |
| 7. ........ | | | |

12. වෘත්තිය/කාර්මික අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් පරියටම වකවානු පිළියෙලට සඳහන් කරන්න.)

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| ........ | ........ | ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ | ........ | ........ |
| ........ | ........ | ........ | ........ | ........ | ........ |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මඟින් ඔබ වරදකරු වී ඇත්තේද ? (එසේ නම්, විස්තර දක්වන්න) :———.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේද ? (එසේ නම් විස්තර දක්වන්න) :———.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :———.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

9–552—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයට බඳවා ගැනීමේ තරග විභාගය—1973**

යථෝක්ත විභාගය පිළිබඳව 1973 ජූනි මස 14 වෙනි දින දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති නිවේදනය සම්බන්ධයෙනි.

2. දැන් මෙම විභාගය පහත සඳහන් මධ්‍යස්ථාන වලදද පැවැත්වීමට කටයුතු යොදා ඇත :—

කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, රත්නපුරය, කෑගල්ල, යාපනය, අනුරාධපුරය, මහනුවර, නුවරඑළිය, කුරුණෑගල, සලාවත, මඩකලපුව, බණ්ඩාරවෙල, ත්‍රිකුණාමලය, අම්පාර.

3. මේ අනුව අයදුම්කරුවන්, (අයදුම්පත්වල සඳහන් කර ඇති පරිදි) තමා සේවය කරන විදුහල අයත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ කොට්ඨාශයන් අනුව විභාග මධ්‍යස්ථාන යොදා ඇත. විභාග මධ්‍යස්ථාන වෙනස් කිරීම පිළිබඳව කරන ඉල්ලීම් ගැන සලකා බලනු නොලැබේ.

පී. උඩගම්,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 08 දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2.

9–523—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

බහුතාක්ෂණික ආයතනය—යාපනය—1974 අධ්‍යයන වර්ෂය

යාපනය බහුතාක්ෂණික ආයතනයේ පහත සඳහන් පාඨමාලාවට 1974 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :—

මෝටර් යාන්ත්‍රික ශිල්පය—(දෙමළ මාධ්‍ය), සන්ධ්‍යා—එක් අවුරුදු.

2. අවශ්‍ය සුදුසුකම් :—

(i) 8 වන ශ්‍රේණිය හෝ 8 වන ප්‍රමාණය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය;

(ii) 1974.01.04 දිනට වයස අවුරුදු 17ට වැඩිවිය යුතුයි.
**සැ. යු.—ප්‍රායෝගික පළපුරුද්ද: අයදුම්කරුවන් මෝටර් නඩත්තු කිරීම් පිළිබඳ වැඩකටයුතුවල යෙදී සිටිය යුතුය.**

3. (i) මෙම පාඨමාලාවට ඇතුළත් කරගනු ලබන්නේ ප්‍රවේශ පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය. නියමිත දිනයන් යථා කාලයේදී අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

(ii) අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් මෙම රෙගුලාසි අවසානයෙහි දී ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව ෆුල්ස්කැප් කඩදාසියක හෝ ලියන කඩදාසියක තමන් විසින්ම පිළියෙල කළ යුතුය.

(iii) සම්පූර්ණ කරන ලද අයදුම්පත් 1973.10.20 දින හෝ ඊට පෙර විදුහල්පති, බහුතාක්ෂණිකායතනය, ඛුවුන් පාර යාපනය යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

(iv) ප්‍රවේශපත් සමග වෙනත් කිසිම ලියවිල්ලක් අමුණා නොඑවිය යුතුය.

4. ප්‍රවේශ පරීක්ෂණය සඳහා විෂයයන් :—

(අ) සාමාන්‍ය යාන්ත්‍රික දැනුම.
(ආ) අංක ගණිතය (8 වන ප්‍රමාණය සඳහා නියමිත අංක ගණිතය නිර්දේශ මාලාව).

5. මසකට රු. 5 බැගින් සෑම අධ්‍යයන වර්ෂයකදීම නියමිත මාස නවයකට විද්‍යාලයීය ගාස්තු ශිෂ්‍යයින්ගෙන් අයකරගනු ලැබේ.

ටී. ඔ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ,
(කාර්මික අධ්‍යාපනය),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973.09.10 දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2.

### ආදර්ශ අයදුම් පත්‍රය

බහුතාක්ෂණිකායතනය—යාපනය

**ප්‍රවේශ පත්‍රය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

2. මුලකුරු සමග නම :————.

3. සම්පූර්ණ ලිපිනය :————.

4. උපන් දිනය :————.

5. ජාතිය :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. රැකියාව කරන ස්ථානය :————.

8. යහතිකය :————.

අයදුම්කරු ඔහුගේ සේවා යෝජකයා හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ ප්‍රාදේශීය ප්‍රධානයා ඉදිරියේදී හෝ අත්සන් කළ යුතුය.

————,
අයදුම්කරුගේ අත්සන.

මෙහි නම සඳහන් අයදුම්කරු මා යටතේ/මගේ ආයතනයේ වැඩ කරන ඉහත නම් සඳහන් අයදුම්කරු අද දින මා ඉදිරියේ අත්සන් කළ බව සහතික කරමි.

————————,
සහතික කරන්නාගේ අත්සන, තනතුර හා තත්ත්වය.

සහතික කරන අයගේ නම :————.

ලිපිනය :————.

දිනය :————.

9–540—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

වාණිජ විද්‍යා සහතික පත්‍ර විභාගය

**මෙම විභාගය 1973 නොවැම්බර් මස 17 වන දින ආරම්භ කරනු ලැබේ**

ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍ර

1. **හැඳින්වීම.**—මෙම විභාගයෙහි ව්‍යවස්ථා වාණිජ විභාග මණ්ඩලය විසින් සම්පාදනය කරන ලදී. එම මණ්ඩලය ලංකා කාර්මික විද්‍යාලය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් සහ විභාග කොමසාරිස් යන අයගෙන් සමන්විතය. මණ්ඩලය වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් විභාගය පවත්වනු ලැබේ.

2. **විභාග ස්ථාන**—

(i) මේ විභාගය පහත සඳහන් මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ. එනම්: කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, රත්නපුරය, කුරුණෑගල, අනුරාධපුරය, කළුතර, යාපනය හා මඩකලපුව.

(ii) තමන්ට අභිමත මධ්‍යස්ථාන දෙකක් අයදුම්කරුවන් විසින් තෝරා ගත යුතුය. අයදුම් කරුවන් සෑහෙන ගණනක් ඇතුළු නොවන කවර මධ්‍යස්ථානයක් වුවත් අවලංගු කරනු ලැබේ.

(iii) අයදුම්කරු විසින් තෝරාගෙන තිබෙන මධ්‍යස්ථානයක් සාමාන්‍ය යෙන් වෙනස් කරනු නො ලැබේ. එහෙත්, විශේෂ අමාරුකම් ඇතිවූ විට කල් ඇතිව දැනුම් දීමක් ලද හොත් ඒ ගැන සලකා බලනු ලැබේ.

3. සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සහතික පත්‍රවලින් එකක්වත් ලබා සිටින අය විය යුතු ය :—

(i) පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය (සිංහල භාෂාවෙන් සාමර්ථ්‍ය ඇතුළු)

(ii) එක විටම (එක වරම)—

(අ) සිංහල භාෂාවෙන්,

(ආ) අංක ගණිතය, වාණිජ අංක ගණිතය, ගණිතය යන මේ විෂය යන්ගෙන් එක් විෂයකින් හා,

(ඉ) තවත් විෂයයන් තුනකින් සමර්ථවීමෙන් ලත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ)

(iii) වාර දෙකකට නොවැඩි වාර ගණනකදී—

(අ) සිංහල භාෂාව (සම්මාන) ද,

(ආ) පහත දැක්වෙන විෂයයන් අතුරෙන් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයක් සහිත විෂයයන් තුනකින් ද ලබන ලද අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) :—

| | |
|---|---|
| ගණන් තැබීම | වාණිජ අංක ගණිතය |
| ටයිප් ගැසීම | අර්ථ ශාස්ත්‍රය |
| ලඝු ලේඛනය | භූගෝල විද්‍යාව |
| වාණිජ ශාස්ත්‍රීය මූල ධර්ම | සිංහල සාහිත්‍යය |

දෙවන භාෂාවක් (දෙමළ හෝ ඉංග්‍රීසි).

**සැළකිය යුතුයි.**—මේ පරීක්ෂණයට ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාවේදී සෑම අයදුම්කරුවකුම අවශ්‍ය සහතික පත්‍ර ලැබීමට සුදුසු වන සේ නියමිත විභාග වලින් සමර්ථව සිටිය යුතුයි. පෙනී සිටි විභාගයක ප්‍රතිඵල බලාපොරොත්තු වෙන් සිටීම මේ පරීක්ෂණයට ඉල්ලුම් පත්‍ර එවීමට සුදුසු කමක් නොවේ. එවැනි අය එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. **විභාගයට ඇතුළත් කිරීම**—

(i) මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම් කරන සියලුම අයදුම්කරුවෝ ලිඛිත පරීක්ෂණයකට ඇතුළත් කරනු ලැබෙත්.

(ii) අයදුම්කරුවකු එසේ ඇතුළත් කිරීම ඔහුගේ සුදුසුකම් පිළිගැනීමක් නො වන්නේය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අයදුම්කරුවකුට සහතික පත්‍රයක් නිකුත් කොට ඇතිනම් එයද ආපසු ගෙන්වා අවලංගු කරනු ඇත. වංචනික ලෙස ක්‍රියා කොට ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් විසින් තීරණය කරන කාල සීමාවක් තුළදී කිසිම විභාගයකට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

3. මධ්‍යස්ථානය :

වඩා කැමති මධ්‍යස්ථානය :————. දෙවැනි ස්ථානය :————

4. (i) ඔබ ඉදිරිපත් වන්නේ කවර සහතිකය හෝ සහතික සඳහාද ?
*(අ) ගණන් තැබීමේ සහතිකය.
*(ආ) ටයිප් ගැසීම හා ලඝු ලේඛන සහතිකය.
*(ඉ) දෙකටම.
*අනවශ්‍ය වචන කපා හරින්න.

(ii) ඉහත විභාගයකදී සම්පූර්ණ වාණිජ සහතිකයක් ලබා ඇති අයදුම්කරුවන්ට පමණයි.
(අ) ලබා ඇති සහතිකයේ නම : ————.
(ආ) සටන් වූ අවුරුද්ද :————
(ඉ) විභාග අංකය :————.
(ඊ) ඉතිරි සහතිකය සම්පූර්ණ කිරීමට දැන් පෙනී සිටින අමතර විෂයයන්ගේ නම් :—
1. ————.
2. ————.

5. විභාග ගාස්තු :

**මුද්දර අලවන කොටුව**

**සැළකිය යුතුයි.**—මුද්දර එක පිට එක නො අලවන්න. මෙහි අවශ්‍ය මුද්දර අලවා අයදුම්කරුගේ අත්සන සහ දිනම යෙදීමෙන් මුද්දර අවලංගු කළ යුතුයි.

මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකරන ලද, හොඳ මුද්දර බව මම සහතික කරමි.

අත්සන :————.

(i) සිංහල භාෂාවෙන් සාමාර්ථ්‍ය— සහිත පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය ලබා සිටින්නේ නම් විස්තර
(අ) වර්ෂය හා මාසය :————.
(ආ) මධ්‍යස්ථානය :————.
(ඉ) විභාග අංකය :————.
(ඊ) සහතික පත්‍ර අංකය :————.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සමත්නම් ඒ පිළිබඳ විස්තර
(අ) වර්ෂය හා මාසය:————.
(ආ) මධ්‍යස්ථානය :————.
(ඉ) විභාග අංකය :————.
(ඊ) සහතික පත්‍ර අංකය:————.

(උ) සාමාර්ථ්‍ය ලත් විෂයයෝ : 1.————. 5.————.
2.————. 6.————.
3.————. 7.————.
4.————. 8.————.

7. **අයදුම්කරුගේ සහතිකය :**

මේ ආකෘති පත්‍රයෙහි ලියන ලද කරුණු සැබෑ බව මම සහතික කරමි. තවද විභාග කොමසාරිස් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලින් බැඳී සිටීමට ද එකඟ වෙමි.

දිනය :————. අත්සන :————.

මේ අයදුම් පත්‍රයෙහි අවශ්‍ය සහතිකය ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කළ පාසලක ප්‍රධානයකු හෝ එවැනි පාසලක එම තත්ත්වයේ සිට විශ්‍රාම ලත් අයකු, කොට්ඨාශයේ ග්‍රාමසේවක තැන, සමාදාන විනිශ්චය කාරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, පෙරකදෝරු කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, නාවුක, ගගන හෝ ගොඩ යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමක පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු හෝ ලවා සම්පූර්ණ කරවා ගත යුතුය.

…………වන මට ඉහත සඳහන් අයදුම්කරු……………………පදිංචි වූ කෙනෙකු බව ද, මා ඔහු හොඳාකාර හඳුනන බව ද, 197… ක් වූ…………… ……මස…………වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බව ද සහතික කරමි.

ලිපිනය :————.

සහතික කරන අයගේ අත්සන :————.

තරාතිරම :————.

දිනය :————.

වෙනත් කරුණු :————.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**විභාගාපේක්ෂකයන් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂය කට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හතනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපෙක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහු ගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිස්යට පැමිණිලි කිරීම ;

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සමීක්ෂණයට යටත් වන්නේය.

නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතින්ගේ විශෙෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතුයි. තමන්ට නියම නො කරන ලද ආසනයක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයයි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුයි. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්‍ය මණ්ඩලයේ කෙනාකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පත්‍රිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙණු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නො ලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සල කනු ලැබේ. හඳුනා ගත නො හැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුය. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියාකිරීමකැයි සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අතා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට අමුණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ සැහැල්ලු ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම

දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකට ප්‍රශ්නයට, පිළිතුරු දෙ තැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සෑද හෝ ගණන් කොහෙත්ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්ටයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූප යෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, ෆයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තක ව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපත කින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම් කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදවු ලබාගැනී මෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතු ය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂක යකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගා පේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතින්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. . එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසිය කට භාජන විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සල කනු ලැබේ.

### විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සට සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදන්නේ නම් විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලා ධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග, ශාලාවේ දී ඉදිරිපත් නො කළ හොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියනකඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතිට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජන යට ගත හැකි වනසේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලි ව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකි ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනු ක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදි ව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ, පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍ර විභාගාශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාරදිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වුවකුසේ සලකනු ලැබීමට ද හේතුවිය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ විදියේ,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

9-629—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද ... | 73.08.29 | බදාද | දවල් 12.00 |
| | 73.09.14 | සිකුරාද ... | 73.09.05 | බදාද | දවල් 12.00 |
| | 73.09.21 | සිකුරාද ... | 73.09.11 | අඟහරුවාද | දවල් 12.00 |
| | 73.09.28 | සිකුරාද ... | 73.09.19 | බදාද | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.